## කුරුණෑගල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

තුත්තිරිපිටිගම, කඩවලගෙදර පදිංචි බමුනු මුදියන්සෙලාගේ සිංගිරිබණ්ඩා ........................................ පැමිණිලිකාරයා.

අඹකඩවර පදිංචි විශ්‍රාමලත් ගම් මුලාදෑනියා පී. ඇම්. කිරිමුදියන්සේ ........................................ ගැණුම්කරු.

නොම්මරය : 350/ඇස්. එදිරිව

උඩහීපන්පොල පදිංචි ඇස්. බී. ඩබ්ලිව්. සෙනෙවිරත්න ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ ඇස්. බී. ඩබ්ලිව්. සෙනෙවිරත්න් වන විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966ක් වූ ඔක්තෝබර් මස 17 දින ප. ව. 3 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙවමැදිහත්පත්තුවේ තිස්සව කෝරළේ සියඹලාකඩවර පිහිටි දියගිල්මේ කුඹුර වී හය පැලක පමණ වපසරියට මායිම් :—උතුරට : මොහොතාට සහ තවත් අයට අයිති කුඹුර ද ; නැගෙනහිරට : වත්තේ වැව්රොද ; දකුණට : පිනිට සහ තවත් අයට අයිති කුඹුර ද ; බස්නාහිරට : පිනාට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි කුඹුරෙන් නොබෙදූ හයෙන් පස් පංගුව. ලියා පදිංචි අංකය : ඩී. 233/127.

ලයනල් අ. පොතුහැර,
වයඹ පළාතේ පිස්කල් තැන වෙනුවට.

වර්ෂ 1966 අගෝස්තු මස 25 වැනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

9-385

